ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 සැප්තැම්බර් මස 28 වැනි දින |

## 2017 ජූලි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

අපනයන ඉහළ යෑම හා මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වුවද, 2017 ජූලි මාසයේදී අපනයන ආදායම වැඩි වුවද ආනයන වියදම වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය, 2016 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පුළුල් විය. 2017 ජූලි මාසයේ දී සංචාරක ඉපැයීම් සුළු වශයෙන් අඩු වූ අතර, පසුගිය මාස හතර පුරා පැවති අඩුවීමේ ප්‍රවණතාව වෙනස් කරමින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ ගියේය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම්, රජය වෙත ලැබුණු දිගුකාලීන ණය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි තුන්වන වාරිකය ලැබීම මෙන්ම කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ අඛණ්ඩ ආයෝජන සමඟ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් තවදුරටත් ශක්තිමත් විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2017 මාර්තු මාසයේ සිට දක්නට ලැබුණු අපනයන වර්ධනය වීමේ ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගනිමින්, 2017 ජූලි මාසයේ දී අපනයන ආදායම මෙම වසර තුළ දෙවැනි වරටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා වර්ධනය විය. මේ අනුව, 2017 ජූලි මාසයේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,016 ක් දක්වා සියයට 13.9 කින් වර්ධනය විය. අපනයන වර්ධනය සඳහා කාර්මික අපනයන ඉහළම දායකත්වයක් දැක්වූ අතර, දෙවනුව කෘෂිකාර්මික අපනයන දායක විය.

ප්‍රධාන වශයෙන්ම, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 ජූලි මාසයේ දී කාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 757 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. පසුගිය මාස දෙක තුළ පැවති රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පහළ යෑමේ ප්‍රවණතාව වෙනස් කරමින් එම අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 467 ක් දක්වා සියයට 9.6 කින් ඉහළ ගිය අතර, එය මෙම වසර තුළ මෙතෙක් වාර්තා වූ ඉහළම රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම වේ. 2017 මැයි මාසයේ දී ජී.එස්.පී. ප්ලස් (GSP+) සහනය නැවත ලබා ගැනීමේ යහපත් බලපෑම පිළිබිඹු කරමින් 2017 ජූලි මාසයේ දී යුරෝපා වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයනවලින් ලද ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 188 ක් දක්වා සියයට 10.6 කින් ඉහළ ගියේය. මෙම මාසය තුළ, ඇමෙරිකා එක්සත් ජනපදය සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත යොමු වූ ඇඟලුම් අපනයන තුළින් ලද ආදායම් ද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 7.9 කින් සහ සියයට 6.5 කින් වර්ධනය විය. මේ අතර, ආහාර, පාන වර්ග සහ දුම්කොළ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 34 ක් දක්වා සියයට 46.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, සියලුම උප කාණ්ඩවල ඉහළ ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කරමින් 2017 ජූලි මාසයේ දී රබර් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.2 කින් ඉහළ ගියේය. නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරනු ලබන ඉන්ධනවල අපනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2017 ජූලි මාසයේ දී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 21.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, මෙම මාසය තුළ විලවුන් වර්ග මූලික කරගත් රසායනික නිෂ්පාදිත, ව්‍යවහාර මුදල් නෝට්ටු මූලික කරගත් මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ මූලලෝහ හා උපාංග අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවද,

2017 ජූලි මාසයේ දී සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම පහළ ගියේය.

ප්‍රධාන වශයෙන් තේ අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළයෑම හේතුවෙන් 2017 ජූලි මාසයේ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 253 ක් දක්වා සියයට 21.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තේ අපනයන මිල ගණන් සහ අපනයන පරිමා යන දෙකම ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 143 ක් දක්වා සියයට 32.7 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තේ කිලෝග්‍රෑමයක් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල 2016 ජූලි මාසයේ පැවැති එ.ජ. ඩොලර් 4.19 සිට 2017 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් 5.36 ක් දක්වා සියයට 27.8 කින් ඉහළ ගිය අතර, 2016 වසර අවසානය වන විට එය එ.ජ. ඩොලර් 4.86 ක් විය. 2017 ජූලි මාසයේ දී තේ අපනයන පරිමාව කිලෝග්‍රෑම් මිලියන 26.7 ක් දක්වා සියයට 3.8 කින් වර්ධනය වූ අතර, එය මෙම වසර තුළ මෙතෙක් වාර්තා වූ ඉහළම තේ අපනයන පරිමාව වේ. මීට අමතරව, යුරෝපා වෙළඳපොළ වෙත අපනයනය කරනු ලැබූ මුහුදු ආහාරවලින් ලද ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 65.1 ක ඉහළ යෑමක් වාර්තා කරමින් 2017 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 20 ක් දක්වා සියයට 42.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මුහුදු ආහාර අපනයනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම කෙරෙහි යුරෝපා වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ස්ථාපිත කිරීම හේතු විය. මේ අතර, සෑම උප කාණ්ඩයකම පාහේ අපනයන පරිමාව ඉහළ යෑම පිළිබිඹු කරමින් කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 14.0 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 ජූලි මාසයේ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සහ එළවළු අපනයන ආදායම පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, තේ, ප්‍රවාහන උපකරණ, ඛනිජතෙල් නිෂ්පාදිත, කුළුබඩු සහ මුහුදු ආහාර අපනයනය කිරීමෙන් ලැබූ ඉහළ ආදායම හේතුවෙන් 2017 වසරේ පළමු මාස හත තුළ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,413 ක් දක්වා සියයට 6.5 කින් වර්ධනය විය. කෙසේ වුවද, සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදය තුළ, රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම පහළ ගියේය.

2017 වසරේ පළමු මාස හත තුළ ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයන සඳහා වූ ප්‍රධාන වෙළඳපොළ ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය වූ අතර

එම රටවල් වෙත සිදු කරන ලද අපනයන, මුළු අපනයන ආදායමෙන් සියයට 50 ක් පමණ විය.

### සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 ජූලි (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-ජූලි (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන-ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **678.9** | **757.3** | **11.6** | **4,683.3** | **4,823.1** | **3.0** |
| රෙදිපිළි හා ඇඟලුම් | 425.6 | 466.6 | 9.6 | 2,940.2 | 2,850.2 | (3.1) |
| එයින්, ඇඟලුම් | 405.2 | 441.1 | 8.8 | 2,782.3 | 2,685.8 | (3.5) |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 22.8 | 33.5 | 46.8 | 196.8 | 224.3 | 14.0 |
| රබර් නිෂ්පාදිත | 68.2 | 78.5 | 15.2 | 440.2 | 467.1 | 6.1 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 30.1 | 36.6 | 21.5 | 162.4 | 213.5 | 31.5 |
| රසායනික නිෂ්පාදිත | 9.1 | 13.7 | 50.9 | 74.5 | 83.9 | 12.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.3 | 6.3 | 167.5 | 12.5 | 24.0 | 91.8 |
| මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.1 | 9.5 | 56.1 | 42.9 | 60.9 | 42.0 |
| ප්‍රවාහන උපකරණ | 6.4 | 6.7 | 5.2 | 73.5 | 131.7 | 79.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 18.3 | 17.2 | (6.0) | 166.6 | 141.1 | (15.3) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 19.6 | 12.8 | (34.8) | 101.2 | 90.5 | (10.6) |
| වෙනත් | 70.4 | 75.9 | 7.8 | 472.4 | 535.9 | 13.4 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **207.9** | **253.3** | **21.8** | **1,312.6** | **1,559.7** | **18.8** |
| තේ | 107.8 | 143.0 | 32.7 | 726.1 | 871.4 | 20.0 |
| මුහුදු ආහාර | 14.2 | 20.3 | 42.5 | 97.7 | 137.4 | 40.6 |
| කුළුබඩු | 33.1 | 37.7 | 14.0 | 158.4 | 198.4 | 25.3 |
| සකස් නොකළ දුම්කොළ | 1.4 | 3.6 | 152.2 | 17.7 | 20.0 | 13.0 |
| පොල් | 31.8 | 32.5 | 2.2 | 206.0 | 206.3 | 0.2 |
| රබර් | 1.6 | 2.1 | 33.3 | 18.6 | 26.1 | 40.1 |
| එළවළු | 3.1 | 2.3 | (26.3) | 16.3 | 16.9 | 3.7 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 14.9 | 11.8 | (21.1) | 71.8 | 83.2 | 15.9 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **4.7** | **5.3** | **11.0** | **25.9** | **30.6** | **18.2** |
| **මුළු අපනයන** | **891.5** | **1,015.9** | **13.9** | **6,021.8** | **6,413.4** | **6.5** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

2017 ජූලි මාසයේ දී ආනයන වියදම ඉහළ ගිය අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වසරේ අඩුම ආනයන වියදම වාර්තාවීමේ පදනම් බලපෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය.  මේ අනුව, 2017 ජූලි මාසයේ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,591 ක් දක්වා සියයට 11.1 කින් වර්ධනය විය. අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

2017 ජූලි මාසයේ දී ප්‍රධාන වශයෙන්ම, ඉන්ධන, රත්‍රන් සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 902 ක් දක්වා සියයට 28.0 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම පිරිපහදු කළ ඛනිජතෙල් ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2017 ජූලි මාසයේ ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 216 ක් දක්වා සියයට 51.7 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, 2017 ජූලි මාසයේ දී බොරතෙල් ආනයන පරිමාව අඩු වුවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් බොරතෙල් ආනයන වියදම සියයට 2.8 කින් ඉහළ ගියේය. බොරතෙල් බැරලයක් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල 2016 ජූලි මාසයේ දී වූ එ.ජ. ඩොලර් 46.10 සිට 2017 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් 49.75 දක්වා ඉහළ ගියේය. තවද, රත්‍රන් ආනයන පරිමාව ඉහළයෑම හේතුවෙන් මෙම මාසය තුළ රත්‍රන් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 62 ක් දක්වා සියයට 182.0 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඉදිරි කාලයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහළ යෑමේ හැකියාවක් පෙන්නුම් කරමින් රෙදිපිළි (fabrics) සහ කෙඳි වර්ග ප්‍රධාන කොටගත් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සියයට 19.7 කින් ඉහළ ගියේය. මේ අතර, මෙම මාසය තුළ අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සඳහා මූල ලෝහ, තිරිඟු හා ඉරිඟු සහ ආහාර සැකසුම් ආනයන ඉහළ යෑම ද විශාල වශයෙන් දායක විය. කෙසේ වුවද, 2017 ජූලි මාසයේ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 67.6 කින් පහළ ගිය අතර, 2016 ජූලි මාසයේ සිමෙන්ති ක්ලින්කර ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ යෑමෙන් වූ පදනම් බලපෑම මින් පිළිබිඹු විය.

මේ අතර, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අඩු වුවද, ආහාර හා පාන වර්ග ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2017 ජූලි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 334 ක් දක්වා සියයට 3.4 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම, සහල් ආනයන වියදම ඉහළ යෑම

හේතුවෙන් 2017 ජූලි මාසයේ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 10.2 කින් ඉහළ ගියේය. මේ අනුව, සහල්වල සාමාන්‍ය ආනයන මිල ගණන්වල අඩුවීමක් දක්නට ලැබුණද, දේශීය වෙළඳපොළ තුළ පැවති සහල් හිඟය සපුරාලීම සඳහා සහල් ආනයනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් සහල් ආනයන පරිමාව සැලකිය යුතු ලෙස වැඩිවීම තුළින් සහල් ආනයන වියදම අඛණ්ඩව ඉහළ ගියේය. මීට අමතරව, යතුරු පැදි හා මෝටර් රථ ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2017 ජූලි මාසයේ පෞද්ගලික රථ වාහන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 15.9 කින් ඉහළ ගියේය. මේ අතර, මෙම මාසය තුළ විදුලි සන්දේශ උපකරණ සහ ගෘහ හා දැව භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 ජූලි මාසයේ දී කුළුබඩු, සීනි, එළවළු සහ රෙදිපිළි හා උපාංග ආනයන වියදම් පහළ ගියේය.

සියලුම උපකාණ්ඩ ආනයනවල අඩුවීමක් පිළිබිඹු කරමින්, 2017 ජූලි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 352 ක් දක්වා සියයට 12.7 කින් පහළ ගියේය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස්, විදුලි සන්දේශ උපකරණ, ටර්බයින සහ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනු ලබන යන්ත්‍රසූත්‍ර ආනයනය පහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 13.2 කින් පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ සිමෙන්ති, යකඩ හා වානේ සහ යකඩ හා වානේ ආශ්‍රිත උපාංග ආනයනය අඩුවීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 8.0 කින් පහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන්ම, ත්‍රීරෝද රථ සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා කැබ්රථ වැනි රථවාහන ආනයනය අඩුවීම හේතුවෙන් 2017 ජූලි මාසයේ දී ප්‍රවාහන උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 20.9 කින් පහළ ගියේය.

මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, සමුච්චිත වශයෙන් සැලකූවිට, 2017 වසරේ පළමු මාස හත තුළ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 11,742 ක් දක්වා සියයට 9.2 කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ඉන්ධන, රත්‍රන් සහ සහල් ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන්ම හේතු විය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ යන්ත්‍රසූත්‍ර හා උපකරණ, පෞද්ගලික රථවාහන සහ පොහොර ආනයන වියදම් පහළ ගියේය.

ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය යන රටවල් 2017 වසරේ පළමු මාස හත තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවැති අතර, එම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන, මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.


# සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2016 ජුලි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජුලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-ජුලි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-ජුලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **323.4** | **334.5** | **3.4** | **2,431.1** | **2,558.4** | **5.2** |
| ආහාර හා පානවර්ග | 120.8 | 133.1 | 10.2 | 896.5 | 1,056.6 | 17.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.1 | 24.2 | 2,077.6 | 12.1 | 162.3 | 1,242.2 |
| එයින්, සහල් | 0.5 | 23.3 | 4,428.6 | 6.4 | 155.1 | 2,327.3 |
| පාන වර්ග | 6.9 | 8.4 | 20.7 | 49.4 | 47.2 | (4.4) |
| මුහුදු ආහාර | 17.8 | 18.3 | 2.9 | 139.2 | 129.1 | (7.2) |
| තෙල් සහ මේද | 3.6 | 2.8 | (21.4) | 20.8 | 27.4 | 31.2 |
| එළවළු | 29.7 | 26.2 | (11.9) | 228.1 | 202.9 | (11.0) |
| සීනි හා රසකැවිලි | 22.5 | 18.9 | (15.9) | 156.2 | 169.6 | 8.6 |
| කුළුබඩු | 9.8 | 5.6 | (42.4) | 76.7 | 56.3 | (26.6) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 29.4 | 28.7 | (2.3) | 214.0 | 261.8 | 22.3 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 202.6 | 201.3 | (0.6) | 1,534.6 | 1,501.7 | (2.1) |
| රථවාහන | 53.6 | 62.2 | 15.9 | 472.9 | 432.4 | (8.6) |
| විදුලි සන්දේශ උපකරණ | 16.1 | 18.7 | 15.6 | 132.3 | 151.9 | 14.8 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 45.4 | 41.7 | (8.2) | 309.7 | 290.4 | (6.2) |
| රෙදිපිළි හා උපාංග | 29.2 | 22.4 | (23.3) | 201.2 | 221.2 | 10.0 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 58.3 | 56.5 | (3.1) | 418.5 | 405.9 | (3.0) |
| **2. අන්තර් භාණ්ඩ** | **704.7** | **901.8** | **28.0** | **5,485.1** | **6,250.9** | **14.0** |
| ඉන්ධන | 142.3 | 215.9 | 51.7 | 1,320.2 | 1,840.4 | 39.4 |
| එයින්, බොරතෙල් | 33.9 | 34.8 | 2.8 | 301.6 | 314.2 | 4.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 106.9 | 180.7 | 69.1 | 920.5 | 1,355.0 | 47.2 |
| ගල්අඟුරු | 1.6 | 0.4 | (78.1) | 98.1 | 171.2 | 74.5 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 32.5 | 72.1 | 121.8 | 245.5 | 400.1 | 63.0 |
| එයින්, රත්‍රන් | 22.1 | 62.4 | 182.0 | 167.7 | 337.4 | 101.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 198.0 | 236.9 | 19.7 | 1,544.7 | 1,543.9 | (0.1) |
| මූල ලෝහ | 25.0 | 48.8 | 94.9 | 215.2 | 300.7 | 39.7 |
| තිරිඟු හා ඉරිඟු | 8.3 | 31.4 | 277.9 | 141.4 | 193.9 | 37.2 |
| ආහාර සැකසුම් | 20.5 | 30.6 | 49.2 | 136.9 | 177.4 | 29.6 |
| පොහොර | 3.8 | 10.6 | 182.0 | 78.6 | 49.7 | (36.8) |
| සකස් නොකළ දුම්කොළ | 4.2 | 4.7 | 12.0 | 37.0 | 31.7 | (14.2) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත උපාංග | 49.3 | 48.8 | (1.1) | 346.0 | 351.4 | 1.6 |
| ඛනිජ නිෂ්පාදිත | 46.0 | 14.9 | (67.6) | 128.2 | 108.7 | (15.2) |
| වෙනත් | 174.7 | 187.1 | 7.1 | 1,291.4 | 1,252.9 | (3.0) |
| **3. ආයෝජන භාණ්ඩ** | **403.1** | **351.9** | **(12.7)** | **2,829.9** | **2,799.0** | **(1.1)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 224.7 | 195.0 | (13.2) | 1,596.5 | 1,514.0 | (5.2) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 120.9 | 111.3 | (8.0) | 881.6 | 900.9 | 2.2 |
| ප්‍රවාහන උපකරණ | 57.0 | 45.1 | (20.9) | 347.9 | 378.9 | 8.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.6 | 0.5 | (1.1) | 3.8 | 5.3 | 38.3 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.6** | **3.0** | **91.1** | **7.7** | **133.9** | **1,628.4** |
| **මුළු ආනයන** | **1,432.8** | **1,591.1** | **11.1** | **10,753.8** | **11,742.2** | **9.2** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය








මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

### වෙළඳ ශේෂය

වෙළඳ හිඟය 2016 ජූලි මාසයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 541 සිට 2017 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 575 ක් දක්වා පුළුල් විය. මේ අතර, 2017 වසරේ පළමු මාස හත තුළ සමුච්චිත වෙළඳ හිඟය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,732 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 5,329 ක් දක්වා ඉහළ ගියේය.

## රූප සටහන 2: මාසික වෙළඳ ශේෂය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

**සංචාරක ඉපැයීම්**

2017 වසරේ ජූලි මාසයේ දී සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 1.8 කින් අඩු වූ අතර, සංචාරක පැමිණීම් සංඛ්‍යාව 205,482 ක් විය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස හත තුළ දී, මුළු සංචාරක පැමිණීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 3.6 කින් 1,215,926 ක් දක්වා වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය යන රටවල් 2017 වසරේ පළමු මාස හත තුළ දී සංචාරකයින් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේ දී පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 51.4 ක් විය. 2017 වසරේ ජූලි මාසයේ දී සංචාරක ඉපැයීම්[1] ද සංචාරක පැමිණීම් මෙන්ම අඩුවීමක් වාර්තා කළේය. ඒ අනුව, මාසය තුළ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 352.5 ක් වූ අතර, වසරේ පළමු මාස හත තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 2,013.5 සිට එ.ජ. ඩොලර් මිලියන 2,086.1 ක් දක්වා වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**

2017 වසරේ ජූලි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ[2], පසුගිය මාස හතර තුළ පැවති ප්‍රවණතාවයෙහි වෙනසක් ඇති කරමින්, එ.ජ. ඩොලර් මිලියන 592.1 ක් දක්වා සියයට 3.4 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස හත තුළ දී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම්, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,185.9 සිට එ.ජ. ඩොලර් මිලියන 3,946.7 ක් දක්වා සියයට 5.7 කින් අඩු විය.

---

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2017 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

[2] ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා ආර්ථික දර්ශකයන්හි ප්‍රකාශයට පත්කරන ලද 2017 වසරේ ජූලි මාසය සඳහා වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දත්ත, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කළ දත්ත සංශෝධනය වීම හේතුවෙන් සංශෝධනය විය.

**මූල්‍ය ලැබීම්**

2017 වසරේ පළමු මාස හත තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 252.7 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය පිළිවෙළින් ද්විතියික වෙළඳපොළ හා ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 169.3 ක හා එ.ජ. ඩොලර් මිලියන 83.4 ක ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන අඛණ්ඩව ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය 2017 වසරේ ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 134.6 ක ශුද්ධ ලැබීමක් විය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස හත තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 18.4 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2017 වසරේ පළමු මාස හත තුළ දී ඒකාබද්ධ ණය පහසුකම තුළින් ලද මුදල් ද ඇතුළු රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 387.5 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 483.0 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මීට අමතරව, 2017 වසරේ ජූලි මාසයේ දී, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමට අදාල එ.ජ. ඩොලර් මිලියන 167.2 ක වටිනාකමින් යුතු තුන්වැනි වාරිකය ද ශ්‍රී ලංකාවට ලැබුණි.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2017 වසරේ පළමු මාස හත තුළ දී සමස්ත ගෙවුම් තුලනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 356.0 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,448.5 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2017 වසරේ ජූලි මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.9 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 6.7 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.3 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.0 ක් විය.

ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 සැප්තැම්බර් මස 27 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.1 කින් මධ්‍යස්ථ ලෙස අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යුරෝවලට සාපේක්ෂව සියයට 12.5 කින් ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 10.6 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 5.5 කින් ද, කැනේඩියානු ඩොලරයට සාපේක්ෂව සියයට 10.3 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට

සාපේක්ෂව සියයට 10.1 කින් ද සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 5.7 කින් ද අවප්‍රමාණය විය.

### සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 891.5 (ආ) | 1,015.9 | 13.9 | 6,021.8 (ආ) | 6,413.4 | 6.5 |
| ආනයන | 1,432.8 | 1,591.1 | 11.1 | 10,753.8 | 11,742.2 | 9.2 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -541.3 (ආ) | -575.3 | - | -4,732.0 (ආ) | -5,328.8 | - |
| සංචාරක ඉපැයීම් | 359.2 (ආ) | 352.5 | -1.8 | 2,013.5 (ආ) | 2,086.1 | 3.6 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (ඇ) | 572.8 | 592.1 | 3.4 | 4,185.9 | 3,946.7 | -5.7 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 10.1 | 23.4 | 132.0 | -30.8 | 252.7 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඉ) එයින්, | 2,186.8 (ආ) | 269.6 | -87.7 | 3,323.9(ආ) | 3,651.8 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 308.4 | 203.9 | -33.9 | 909.5 | 933.7 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 1,500.0 | - | - | 1,500.0 | 1,500.0 | |
| ඒකාබද්ධ ණය පහසුකම | 300.0 | - | - | 300.0 | 450.0 | |
| දිගුකාලීන ණය | 377.3 (ආ) | 65.7 | -82.6 | 897.6(ආ) | 1,198.4 | |
| ජා.මූ.අ - විස්තීර්ණ ණය පහසුකම | - | 167.2 | - | 168.1 | 167.2 | |
| විදේශීය සෘජු ආයෝජන (ඊ) | - | - | - | 293.0 | 711.2 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා ආර්ථික දර්ශකයන්හි ප්‍රකාශයට පත්කරන ලද 2017 වසරේ ජූලි මාසය සඳහා වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දත්ත, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කළ දත්ත සංශෝධනය වීම හේතුවෙන් සංශෝධනය විය.

(ඈ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඉ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඊ) දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.